

# කනේ ආසාදන

## Ear Infection






**වෛද්‍ය හර්ෂ අලුත්ගේ**
Dr Harsha Aluthge
MBBS, FRACGP, DFM RCGP(UK)
General Practitioner
Greenvale Medical Centre

කනේ ආසාදන ඉතා සුලභ රෝගී තත්වයකි. විශේෂයෙන් කුඩා ළමුන්ගේ නිතර දක්නට ලැබෙන රෝගී තත්වයකි.

අපගේ කන ප්‍රධාන කොටස් තුනකින් සෑදී තිබේ.

01. පිටත කන Outer Ear - පිටතට පෙනෙන කන් පෙත්ත හා ශබ්දය කන් බෙරය කරා ගෙන යන නාලය (Ear Canal) මගින් පිටත කන සෑදී තිබේ.

02. මධ්‍ය කන Middle Ear - පිටතට කන හා මධ්‍ය කන කන් බෙරය (Ear Drum) මගින් වෙන් කරනු ලැබේ.

03. ඇතුලු කන Inner Ear - ශබ්ද තරංග විද්‍යුත් තරංග බවට පරිවර්තන කර හොළයට සම්ප්‍රේශණය කිරීම මෙමගින් සිදුවේ.

කණේ ආසාදන ඉහත කී කොටස් 3න් ඕනෑම එකක ඇතිවිය හැකි අතර විශේෂයෙන් කුඩා ළමුන්ගේ සුළභ වන්නේ මැද කණේ ආසාදන හෙවත් Otitis media යන්නයි.

බැක්ටීරියා, වෛරස් හෝ දිලීර ආසාදන යන තුන් වර්ගයම මීට හේතු කාරක විය හැක.

### කණේ ආසාදන වල රෝග ලක්‍ෂණ මොනවාද ?

ආසාදිත ස්ථානය හා හේතු කාරක වන ක්‍රමය අනුව රෝග ලක්‍ෂණ වෙනස්විය හැක. නමුත් පහත සඳහන් රෝග ලක්‍ෂණ ඉතා සුලභය.

- කණේ වේදනාව
- කන් ඇසීමේ අඩු බවක් දැනීම
- කණෙන් ස්‍රාවයක් පිටවීම
- උණ
- හිසරදය
- කෑම රුචිය අඩුවීම හා ඔක්කාර ගතිය (Nausea)
- කන ඇතුලත හා අවට කැසීම
- කන් පෙත්ත හා කාලය මත සැරව බිබිලි ඇතිවීම
- කන ඇතුලත දෝංකාර දීම වැනි ශබ්ද ඇසීම
- Vertigo - කරකැවිල්ල

### කණේ ආසාදන ඇති වීමට හේතු කාරක මොනවාද ?

අපගේ කන ඉයුස්ටේකිය නාලය (Eu-stachian Tube) මගින් නාසයේ පිටිපස කොටස හා සම්බන්ධ වේ. එමගින් කන ඇතුලත හා පිටත වාතය සමතුලිත කිරීම හා මැද කනේ සිට ස්‍රාවයන් උගුරට ගෙන ඒම සිදු කෙරේ. සාමාන්‍යයෙන් මෙම නාළයේ බිත්ති එකිනෙක මත තෙරපී පවතින අතර බැක්ටීරියා ඇතුලු ආසාදන කාරක උගුරේ හා නාසයේ සිට මැද කනට ඇතුලුවීම වලක්වයි. මෙම කාලය අවහිර වෙතොත් මැද කන ඇතුලත ස්‍රාවයන් හා බැක්ටීරියා වර්ධනය වී මැද කනේ ආසාදන ඇති කරයි.

### කනේ ආසාදන ඇතිවීමට බලපාන සමහර හේතු කාරක හා අවදානම් සාධක පහතින් දැක්වේ.

- සෙම්ප්‍රතිශ්‍යාව, උගුරේ ආසාදන වැනි ශ්වසන පද්ධතිය ආශ්‍රිත රෝගාබාධ
- වායු පීඩනයේ ඇතිවන ක්‍ෂණික වෙනස්වීම්
  උදා:- ගුවන් ගමන්
- කුඩා හෝ අවහිරවූ ඉයුස්ටේනීය නාල පැවතීම
- Cleft palate නැමැති උපතින් ඇතිවන ආබාධය
- කුඩා ළමුන් අපවිත්‍ර ජලයේ පිහිනීම
- පිහිනීමෙන් පසු පිටත කන නිසි පරිදි වියළීමට අතපසු වීම
- උවමනාවට වඩා කන පිරිසිදු කිරීමෙන් කන සිටීම

### කනේ ආසාදන රෝග නිර්නය කරගන්නේ කෙසේද ?

- රෝග ලක්‍ෂණ හා රෝග ඉතිහාසය මගින්
- ඔබගේ වෛද්‍යවරයා Otoscope නැමැති උපකරණයක් මගින් කන ඇතුලත පරීක්‍ෂා කර බැලීම මගින්

### කනේ ආසාදන සඳහා කරන ප්‍රතිකාර මොනවාද?

මේ සඳහා කරන ප්‍රතිකාර විවිධ කනේ ආසාදන වර්ගය අනුව වෙනස් වේ.

ප්‍රධාන ආසාදන වර්ග 2 වන පිටත කනේ ආසාදන හෙවත් Otitis Externa හා මැද කනේ ආසාදන හෙවත් Otitis Media සඳහා කරන ප්‍රතිකාර පහතින් සාකච්ඡා කරමු.

### Otitis Externa

කන් බෙරයට පිටපතින් ඇති නාලයේ ඇතිවන ආසාදන හා ඉදිමීම නිසා මෙය හට ගනී. අපිරිසිදු වතුරට නිරාවරණයවීම හා උවමනාවට වඩා කන පිරිසිඳු කිරීමට යෑම මෙයට හේතුවන ප්‍රධාන කරුණු දෙකයි. ආසාධනය බොහෝ විට බැක්ටීරියා හා දිලීර මගින් සිදුවේ.

මේ සඳහා ඇති ප්‍රතිකාර නම්

- නියමාකාරව කන පිරිසිඳු කිරීම මගින් අපද්‍රව්‍ය ඉවත් කිරීම
- ප්‍රතිජීවක හා ස්ටෙරොයිඩ් අඩංගු දියර ප්‍රතිකාර (Clear Drops)
- ප්‍රතිජීවක පෙති හා කරල් (Oral antibiotics)
- දිලීර නාශක අඩංගු (ear Drops) දියර
- වේදනා නාශක ප්‍රතිකාර
- කන තෙතමනය රහිතව වියළිව තබා ගැනීම

### Otitis media

බොහෝ විට සෙම්ප්‍රතිශ්‍යාව වැනි ආසාදන වලින් පසු හා යුස්ටේකිය අවහිර වීම නිසා කුඩා ළමුන්ගේ හට ගන්නා රෝග තත්වයකි.

ක්‍ෂණිකව ඇතිවන (Acute) හා නිදන්ගත (Chronic) යනුවෙන් වර්ග දෙකක් පවතී.

සමහර විට කන් බෙරය පුපුරා යාමද සිදුවිය හැක. නමුත් බොහෝ අවස්ථාවලදී එය නැවත යථා තත්වයට පත්වීම සිදුවේ.

මේ සඳහා කෙරෙන ප්‍රතිකාර නම්

- වේදනා නාශක
- ප්‍රතිජීවක ඖෂධ (Antibiotics)
- Ear drops - කන තුල සැරව පවතී නම්

නිතර නිතර මෙවන් Acute Otitis media නැමැති ආසාදන ඇතිවීම නිදන්ගත ආසාදන (Chronic Otitis media) ඇතිවීමට හේතුවක් වේ. එමගින් කන් බෙරය පුපුරා යෑම, මැද කනේ ඇති සියුම් අවයව වලට හානි පැමිණීම සිදුවිය හැකිය.

මෙහි අතුරු ප්‍රතිවිපාක වශයෙන් මෙනින්ජයිටිස් (meningitis) නැමැති මොළයේ ඇතිවන ආසාදනය Labyrinthitis නැමැති ශරීරයේ තුලනය පාළනය කරන අවයවයේ ආසාදනය බිහිරි බව (Deafness) යනාදිය කලාතුරකින් ඇතිවිය හැකිය.

එබැවින් ඔබට හෝ ඔබගේ ළමුන්ට කණේ ආසාදනයක් පවතින බවට සැකයක් ඇති වූ විගස පවුලේ වෛද්‍යවරයා හමුවී පරීක්‍ෂා කරවා ගෙන ප්‍රතිකාර ගැනීම හා වලක්වා ගැනීමේ උපදෙස් ලබා ගැනීම වැදගත්ය.